# කිවිළිදිය

ඇළ දොලක කඳු පෙතක ගැටෙන මඳ පවන  ගැන
පුරසඳක පිපි මලෙක ගැමි සිරිය මවන  තැන
සිල්වතක සිනාවක කුරුලු කිචි බිචිය  ගැන
යස රඟට රසකෙරූ කිවිඳි කොයි ඉන්න  තැන

සොඳුරු සිත අහිමි පෙම ළසෝ දුක දැනෙන  ඉම
හදබිලෙක ඇති පහස සිත රැඳුනු පළමු  පෙම
විනිවිදව යන ලෙසින් චිත්ත රූ මැවූ  එම
රසවදන් ලොවට දුන් කිවිඳි කොයි ඉන්න  බිම

නුරාවක නෙත්සරක මුල්ම හාදුවක  රඟ
ල.යන ස.ත තැබූ ත.ත රැගෙන මුන.වතක  මඟ
ඉරුනු හදවත් රුවල පාවෙනා ළසෝ  ගඟ
ඉමක් නොදක.න  අපේ කිවිඳි දුර  නොවේ  ළඟ

ටි. ස. ප්‍රියන්ත කුමාර
ගැබරෝන්  බොට්ස්වානා



# සිතිවිලි රක්ෂිත වනය

අවසන් රුකත්
මහ පොලව බදා ඇද වැටුනු විට
අසංඛ්‍ය දූලි වළා රැලි නැගි නැගී
දෑස් කුහර ගුලි කර පුළුස්සා

සතා සීපාවා සැරි අභිරුචි කල්පනා ලෝකා
තුගු කඳු පාමුල නැගි ඝණ හරිත පදපත්‍ර ජාලා
යටිවියන් උඩුවියන් සැරි සර සියුම් ජල සීරා
අනේක කුහුඹු කදෝපැණි සිතිවිලි සිහින රූරා පෙරා
ලු මෘග සංවර්ෂා අනන්ත කාලාවසානා

දැඩි රුදු බිමකි ගිස් කෙමි බිමකි අද
සෝදා පාළුව ගිය පාංශු නිපාතාදි වැල්ලේ රැලි සුළි පාරා
සිතිවිලි වනය කිසිවෙකුත් ඇතුළු වනු නැති
දිවා රැය නොමැති හින්න වූ රේඛා
පාණ්ඩු පැහැ පොලෝ තලයකි රූ ගත් දූර සහරා
ඇද වැටි දිරා ගිය රුක් කඳින් වැසී ගිය වියලි පෘෂ්ඨා
තැනකි නැති තෙතමන ජල අංශු මුසු ලවණා
නැගෙන්නට හෝ බිම් මලක් වැනි ශුෂ්ක භෞම සාධක බාධා

දැව කඳන් එකල පැටවුනි ද
පිට දේශ දේශාන්තර
මුලිනුපුටා හරිත වන රාජා

තැනින් තැන ගොදුරු ඉව ලැදි
සිංහ කොටි වලස් සේනා
පයට පෑගෙන බිම්පලස් වී හම ගැසී නගන ඝෝෂා

ඉහ වහා ගිය දෘඪතර ශක්ති බන්ධන ලීලා
පෑ ගොර බිරම් ඇත් ගජබ ගිපිදුන් සේනා
දල පැහැර ඈන වැළලුවේ භූ ගර්භ බොල් කවචා

ඉතිරිව ඇත රක්ෂිතය මන්දස්මිතය විදුලි වැට වටලා
ඇතුළු වන්නට ඇවැසිය කහවණු පතුරු මුද්‍රිත සංඥා
අවසර පත්‍ර නේකා

තැන තැන වවා ඇත
පයිනස් ළපලු කැක්ටස් පිටින් ගේනා
සිතිවිලි වලට නැත දේශ සීමා මායිම් රේඛා

තිස්ස රජු වුවද හිරබත්
කමින් ඉනු ඇත මෑනුවොත්
ඊ වෙතට අද මුව සේනා

ධර්මධාරීන් පිට දී සිටි
ලෝ කුහර දියවී උණුව
දැවෙනා කුහර ගිනි කඳු මුදුනා...
මිහිඳු සැරසී මිලිටරි ඇඳුමෙන්
රකී සුන් වන පෙත
වෙස් ගෙන උයන්පල්ලා

**ඩෝසන් ප්‍රීති**

*අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව*
***www.ketapathpawra.com***

# පහන් වැට

## සරෝජා මම



වෙඩි වැදී සිදුරු වූ
තල් ගස් අතු රිකිලි මත
කිරිලියෝ බිජු දමා
සොමිනසින් උරා සඳවත
රතුපාට දූවිල්ල ගැයුවාට
තුටු ගී බී මධුවිත
අකුරු ඇද වූ සරෝජා මං
ජීවිතයට ඉතිරි වූ
නිරුවත වැසූ ඇඳිවත

ඉස්කෝලෙ වසා ඇති
කැඩුණු පුටු මේස බංකුද අවුල් වී ඇති
කළු ලෑල්ලක් තනි වෙලා ඇති
රටහුනුද ගුරුවරුද කාලෙකින් දැක නැති
කවුරු හෝ පෙර ලියූ තාත්තා අකුරු පෙළ
මීදුමක් සේ අපැහැදිලි නිති
දරු පැටව් මටද ඇති
කිසි දිනෙක උන් තාත්තෙක් ගැන
මම සේම අසා නැති

වෙව්ලනා ඇඟිලි තුඩු මැලවීලා
විටමින් කැල්සියම් හිඟව ඇති
හිත ඇතුළෙ මුතු අකුරු සිරවෙලා
ලියවෙන්න කඩදාසි කොළ නැති
පෙරදා වෙඩි හඬට ඇදවුනු අකුරු සේමයි
ජීවිතය ඇදවෙලා ගලා යන හැටි
මඩවලක උපන් මල පරවෙලා
පෙති හැලී සුවඳ මඬටම උරාගත් හැටි

යා වෙනා පාලමක් සිහිනයක දැවටිලා
සිතුවමක් ලෙසින්වත් පෙනෙන්නැති
ගීතයේ පමණක්ද ඉන්නේ අපි
හැමදම වයන පදයට නටන්නට හැකි
තරුද හංගා හිරු එළිය මෙන්
සැබෑ ගීතය ගයන්නට කාලය ඇවිත් ඇති
ඔබ උතුරෙමයි මා දකුණෙමැයි
එකතු වී ගයමු අපි එකම ගීයක්
සියල්ලන්ටම එකමුතුව ජීවිතය විඳින්නට හැකි

**ලක්ෂ්මන් කොඩිතුවක්කු**

## භක්තිය

අනන්තයෙ සිට
හමා ආ
චණ්ඩ සුළං රැලි
ගම අයිනේ
දෙවියන් වැඩ විසූ
සුවිසල් නුග ගස
බිමට පෙරළා
යන්නට ගියේ
කිසිත් සිදු නොකළ
අයුරකිනි

පව්කාර
සුළඟ සමග
සටන් වැද
පොළව සිඹ
නැවත නැගී සිටි
තුත්තිරි ගස
පාගා ගත්
ගැහැණියක්
නුග ගස දෙස බලා
ශෝක වූවාය.

**ශක්තික සත්කුමාර**

## නුඹට කවි මල් මාල

සැමරුම් මල් වත්තෙ  යමි
හැඟුම් එකින් එක  නෙළමි
සිත් බඳුනේ  පුරවගමි
අරගෙන මේසයට  එමි

කඩදහි මත  විසිරුවමි
නටු කඩ කඩ  විසිකරමි
කවි හුය සිතගින්  අඳිමි
එ මල් පෙළට  පටලවමි

පාට රටා  ගලපගමි
ඊට එළිසමය  කියමි
කොළයක සඟවා  නවමි
මිට මොලවා නුඹට  දෙමි

සිනා කාසියක්  මට දී
නුඹ එය දෝතින්ම  ගනි
හුදෙකලා තැනෙක  නැවති
පැළඳගන්න බව  දනිමි

**මහින්ද ප්‍රසාද්**
**මස්ඉඹුල**

## සමාවන්න

එකම ලොවක සිටියත් අපි,
එක්වෙන්නට නොහැකි ලොවක්.....?
ප්‍රේමාදර කතාවකින්
ඔබ අමතක වෙලා නොවෙයි...
කහ සිවුරක් ගත දැරුවේ
නවගුණ වැළ  ගෙල රැඳුණේ.....
නුඹට පිදුණ මගේ හිතත්
නුඹ ළඟ සැමදා රන්දා ...
තව කෙනෙකුට පුද දෙන්නට
තවත් හිතක් නැති හන්දා......
කහ සිවුරක් ගත දවටා
නවගුණ වැල අතට ගත්තෙ....
ලෝකයාගෙ අවමාණෙන්
මව්පියො නිදහස් කරන්න....
නිදහස් ලෝකයට වෙලා
නිතරම නුඹ ගැන සිතන්න
කහ සිවුරක් ගත දරලා
ඇටවැල ගෙල වට දැමුවා..
සමාවන්න බුදුහිමියනි
වංචාවක් කළා නොවෙයි.

**අසෝකා දේවසුරේන්ද්‍ර**
ලෝරියන්ට් - ප්‍රංශය

## පාර්ලිමේන්තුවේ අන්තිම දවස

එන්න රමණී යන්න
ළමයි දෙන්නත් එක්ක
අද පාර්ලිමේන්තුවේ
අන්තිම දවස

පස් අවුරුද්දක්ම
මට බැරිවුණා
ඔයයි ළමයි දෙන්නයි
ගැන හිතන්න
හිතුවෙම රටේ මිනිස්සු ගැන

ෆොටෝ එකක් එහෙම
අරගන්න
මහ ඡන්දෙ අත ළඟ
පැරදුම හිත ළඟ
අපට බැරිවෙයි ගොඩ එන්න
අද පාර්ලිමේන්තුවේ
අන්තිම දවස
විශ්‍රාම වැටුපවත් ලැබුණොත් ගොඩ
නැත්නම් එතනත් මඩ
රමණී

අන්න තියනවා
භෝජනාගාරය
කන තරමක් කන්න
බොන තරමක් බොන්න
අපි හිතුවෙත් නෑනේ
ඕවායින් කන්න බොන්න

සෙංකෝලෙ බබාලට පෙන්වන්න
නිකමට වගේ අසුනක ඉඳගන්න
රමණී

අද පාර්ලිමේන්තුවේ
අන්තිම දවස

**සංජක ප්‍රසාද්**

## දෙමළ තේ කොළ

සිරිපාදේ කන්ද උඩින්
හෙමින් එබී හිරු හොරැහින්
තේ දළු දිලිහෙයි සතුටින්
තංගම්මගේ ඇඟිලි යටින්

හිරු සමගින් අවදි වෙමින්
දවසක ඇරඹුම සමරන ... දෑසට
තේ කොළ
රන් වන් පැහැ පේනවාද
අමුතුම සුවඳින් පමොදිත ... නැහැයට
කහට සුවඳ දැනෙනවාද
නැවුම් රසින් ගත පුබුදන ... දිවගට
තේ කොළ රස දැනෙනවාද

සිංහල ගම් දනවු පුරා
ගමේ ගොඩේ සිදාදියෙ
පැල්පත් මන්දිරේ උනත්
සිංහල අපි දින අරඹන
කහට හරිම රසයි නේද

හිරු එක්කම අවදි වෙලා
සොරෝන්ඩි ගා මුළු යායම
වැහිරෙන් දාදිය මුගුරෙන්
තංගවේළු තවමත් වැඩ

තේ ඉපලේ දෙපා ඇනී
තේ මුළ ලඟ රතු පාටයි
නිමක් නැතිව රොත්ත පිටින්
ලේ උරනා කූඩැල්ලන්
දෙන වදයත් ඉවසාගෙන
තංගවේළු තවමත් වැඩ

සීතල පිණි කැට තැවරුණු
සුන්දර තේ දළු නෙලමින
යායෙන් යායට දිව යන
තංගම්මලා දන්නවා
තේ දළු තරමට සුන්දර
නැති වග නෙලනා කාරිය

කවදාවත් නොයන ලෙසට
කහට වැදී කළු පැහැයෙන්
දෑඟිලි විඳිනා දහදුක
කාහට නම් දැනෙනවාද

තේ දල්ලට වඩා සොඳුරු
අව්වට කළු වුනු මුහුණෙන්
පින්න නොවෙයි බිම සිඹින්නේ
දුක් විඳිනා ඇගෙ කඳුළයි

තේ කූඩෙට වැඩියෙන් බර
ජීවිතයේ බර උහුලන
විළුඹ පැළුනු දෙපා වලට
කෙතරම් දුර යා හැකි වේද

හිරු සමගින් අවදි වෙමින්
දවසක ඇරඹුම සමරන ... දෑසට
තේ කොළ
තංගවේළුගේ ලේවල
රන්වන් බව පේනවාද
අමුතුම සුවඳින් පමොදිත ... නැහැයට
තංගවේළුගේ දහදිය
කහට සුවඳ දැනෙනවාද
නැවුම් රසින් දිව පුබුදන ... දිවගට
තංගම්මගේ කඳුළක රස දැනෙනවාද

සිංහල අපි
තේ කොළ
දෙමළ කියලා දන්නවාද ...?

**ධනංජය තෙන්නකෝන්**